**ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 242 - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ඔක්තෝබර් 06 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 48.40 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 46.45 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.95 ක් හෙවත් සියයට 4.03 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 44.33 | 43.11 | 1.22 | 2.75 |
| මූලධන | 4.07 | 3.34 | 0.73 | 17.94 |
| **එකතුව** | **48.40** | **46.45** | **1.95** | **4.03** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 24201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.00 | 2.44 | 2.00 | 2.39 | 18.00 | 10.11 |

**2.3 විගණන නිරීක්ෂණය**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ආ) වැය විෂයයන් හයක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 කාර්යසාධනය**

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව තනතුරුවල පදවි නාමය වෙනස් කිරීම, නව තනතුරු ඇති කිරීම, තනතුරු ශ්‍රේණිගත කිරීම, අනුමත සේවක සංඛ්‍යාව වැඩි කිරීම, නව අනුප්‍රමාණ හෝ වැටුප් පරිමාණ ඇති කිරීම නැතහොත් දැනට පවත්නා අනු ප්‍රමාණයන් ප්‍රතිශෝධනය කිරීම හෝ තාවකාලික සේවකයින් ස්ථිර සේවක සංඛ්‍යාවට අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. ඒ අනුව වර්ෂ ගණනාවක සිට දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී තෝරාගත් කාර්යයන් කිහිපයක් පමණක් ඇතුළත් කරමින් සැලැසුම් සකස් කර ඇති බවත් දෙපාර්තමේන්තු කාර්යයන් තුළ ඇතුළත් සමහර කාර්යයන් සඳහා සැලැසුම් සකස් කිරීම, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීම සිදු නොවන බවත් නිරීක්ෂණය විය.

(ආ) ගණකාධිකරණ සේවා ව්‍යවස්ථාවට අනුව, අනුමත අධිශ්‍රේණී තනතුරු සංඛ්‍යාව සීමිත වීම නිසා ගණකාධිකරණ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා විශ්‍රාම යාමට පෙර සුදුසුකම් සම්පූර්ණ කළද, අධිශ්‍රේණී තනතුර දක්වා උසස් වීම සඳහා අවස්ථාව ලැබී නොතිබුණි. මේ හේතුවෙන් උසස්වීම් නොලබා විශ්‍රාම යාමට සිදු වී තිබෙන බවත්, එම නිසා අධිශ්‍රේණී

තනතුරු ඇති කිරීම සඳහා කටයුතු කරන ලෙසත් නියෝග අංක 10 මඟින් දන්වා තිබුණි. නමුත් ඒ සඳහා අමාත්‍යාංශ 04 ක තනතුරු 04 ක් ඇති කිරීම සඳහා පමණක් අනුමැතිය ලබාදී තිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 71 හා 2014 මාර්තු 31 දිනැති අංක 2014/03 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සිදුකළ කාර්යයන් සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂාවේදී හඳුනාගත් පරිදි දෙපාර්තමේන්තුව විසින් තනතුරු ඇතිකිරීම, සංශෝධනය කිරීම හෝ අහෝසි කිරීම වැනි කාර්යයන් ඉටුකිරීමේදී අදාළ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා/රැස්වීම් පවත්වා තිබුණු බව සනාථ කිරීමට අවශ්‍ය අත්සන් ලේඛන හා සාකච්ඡා සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව කටයුතු කිරීමේදී එම කාර්යයන් පහසු කර ගැනීම හා මාර්ගෝපදේශනයක් ලෙස භාවිතා කරනු ලබන ක්‍රියාපටිපාටියක් සකස් කර තිබුණි. එම ක්‍රියාපටිපාටියට අනුව ක්‍රියා කරනු ලබන බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2013 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්ය මණ්ඩල සමාලෝචනයේදී දිස්ත්‍රික්ක 15 ක කටයුතු 2015 ජූනි මාසය වන විට අවසන් කර තිබුණි. නමුත් ඉතිරි දිස්ත්‍රික්ක 09 ක කාර්ය මණ්ඩල සමාලෝචනය සඳහා කටයුතු කරමින් පැවැතුණි. මේ නිසා වසර 03 ක් ගත වී තිබුණ ද කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි

(ඊ) 2014 ජූනි මාසයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡාවක් පැවැත්වීමෙන් අනතුරුව ආරම්භ කර තිබූ, 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධ සමාලෝචනයේදී ආයතන 31ක කටයුතු සිදුකිරීමට අපේක්ෂා කර තිබුණු නමුත් විගණිත දිනය වූ 2016 අගෝස්තු 25 දින වන විටත් කටයුතු අවසන් කර නොතිබුණි.

(උ) පොලිස් දෙපාර්තමේන්තුව සඳහා අමතර තනතුරු 21,232ක් අවශ්‍ය බව හඳුනා ගෙන තිබුණත්, තනතුරු 2,559 ක් සඳහා පමණක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. සමාලෝචන කටයුතු අවසන් කර අනුමත නව කාර්ය මණ්ඩලය ආයතනය වෙත ලබා දී තිබුණි. නමුත් නව තනතුරු අනුමත කර දෙන ලෙස ඉල්ලීම් වරින් වර ඉදිරිපත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 13 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 45 | 35 | 10 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 14 | - |
| | එකතුව | 82 | 64 | 18 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයෙහි කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පද්ධති පවත්වා ගැනීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වුවද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් සත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු ඇතුළත් කරමින් තොරතුරු පද්ධති පවත්වා ගෙන යාමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.